AAT III – 2026 January Examination

Management Accounting and Finance

Amila Sampath Mudalige

ACA(With title of “Youngest CA Member of 2024”), MAAT(Prize winner), Bsc. Finance (Special) USJ (First Class)

Process Costing

(A) **සීමාසහිත ගොටෝ සමාගම,** පෙරසැරි ක්‍රියාවලි කිපයක් හරහා **C2 නිෂ්පාදිතය,** නිෂ්පාදනය කරනු ලබයි. රු.42,575,000/- ක් පිරිවැය වූ අමුද්‍රව්‍ය මිටර් 300,000 ක් **I වන පෙරසැරිය** තුලට ඇතුලත් කරන ලද අතර, වර්ෂය තුලදී සෘජු ශ්‍රමය ලෙස රු.27,690,000/- ක් සහ විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය වියදම් ලෙස රු.16,614,000/- ක් **I වන පෙරසැරිය** වෙනුවෙන් දරණ ලදී.

වර්ෂය ආරම්භයේදී නොනිමි තොග මිටර් 25,000 ක් වූ අතර, පහත සඳහන් නිමැවුම් මට්ටම් සම්පූර්ණ කර තිබුණි:

සෘජු ද්‍රව්‍ය	100% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.3,750,000/- කි.
සෘජු ශ්‍රමය	25% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.534,000/- කි.
විචල්‍ය පොදුකාර්ය	20% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.199,000/- කි.

ආරම්භක නොනිමි තොගය, සාමාන්‍ය පිරිවැය මත පදනම් වේ.

වර්ෂය අවසානයේදී, මිටර් 288,000 ක් **II වන පෙරසැරි** ගිණුමට මාරුකළ අතර, මිටර් 32,000 ක් අවසාන නොනිමි තොගයේ පැවති අතර ඒවායේ සම්පූර්ණ කිරීමේ මට්ටම් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ විචල්‍ය පොදුකාර්ය සඳහා පිළිවෙලින් 100%, 50% සහ 45% ක් විය.

සාමාන්‍ය අපතය, යෙදවුම් අමුද්‍රව්‍යවලින් 5% ක් වන අතර, ඒවා මිටරයක් රු.40/- බැගින් විකිණිය හැකිය.

ඔබ විසින් කළ යුතු දෑ:

සමානුපාතික ඒකක සහ පිරිවැය දැක්වෙන ප්‍රකාශනය සහ **I වන පෙරසැරි** ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 14)

NPV

සීමාසහිත Row සමාගම, විසින් විශාල නැව් සඳහා අවශ්‍ය විශේෂිත වූ අමතර කොටස් නිෂ්පාදනය කරනු ලබයි. මෙම කොටස් නිෂ්පාදනය සඳහා භාවිත කරන ප්‍රධාන යන්ත්‍රයේ සඵලදායී අයුකාලය අවසන් වී ඇති අතර, මෙම යන්ත්‍රය ගිණුම්කරණ සහ බදු කටයුතු සඳහා ද සම්පූර්ණයෙන්ම ක්ෂයවීම් සිදුකොට ඇත. කෙසේවෙතත්, පවතින යන්ත්‍රය නැවත පිළිසකර කිරීමට සමාගමේ කළමනාකාරිත්වය තීරණය කොට ඇත.

යන්ත්‍රය නැවත පිළිසකර කිරීම සඳහා පිරිවැය රු.65,000,000/- ක් වැය වෙතැයි අපේක්ෂා කරන අතර එමගින් යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය තවත් වර්ෂ 5 ක් තිබෙන බව අපේක්ෂා කරනු ලැබේ. 5 වන වර්ෂය අවසානයේ එහි අපේක්ෂිත සුන්බුන් අගය රු.5,000,000/- ක් වේ. බදු අරමුණු සඳහා වාර්ෂිකව 25% ක ප්‍රාග්ධන දීමනාවකට මෙම පිළිසකර කිරීමේ පිරිවැය සලකා බැලිය හැකි අතර, සමාගමේ ගිණුම් කටයුතු සඳහා මෙය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

මේ සඳහා වන කාරක ප්‍රාග්ධන ආයෝජනය රු.6,000,000/- ක් වන අතර, ව්‍යාපෘති කාලය අවසානයේදී එය නැවත අයකරගනු ලබන බව උපකල්පනය කෙරේ.

මෙම යන්ත්‍රය භාවිත කරමින් නැව් සඳහා අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන්නේ නම් සමාගමේ විකුණුම් පහත සඳහන් පරිදි වනු ඇතැයි අපේක්ෂා කෙරේ:

වර්ෂය	විකුණුම් (ඒකක)
1	4,000
2	6,000
3	8,000
4	5,000
5	4,000

පළමු වර්ෂය තුළදී, ඒකකයක විකුණුම් මිල රු.20,000/- ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පළමු වර්ෂය තුළදී, ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය රු.10,000/- ක් වනු ඇත. ඊට පසු විචල්‍ය නිෂ්පාදන පිරිවැය සහ විකුණුම් මිල උද්ධමන අනුපාතයට සාපේක්ෂව වැඩිවීමට නියමිත අතර, අපේක්ෂිත උද්ධමන අනුපාතය වර්ෂයකට 8% ක් වේ. ස්ථාවර පිරිවැය ක්ෂයවීම් හැරුණු විට වර්ෂයකට රු.9,500,000/- ක් වන බවට ඇස්තමේන්තු ගතකොට ඇත.

විකුණුම් වැඩිකර ගැනීමේ අරමුණින්, සමාගම විසින් පළමු වර්ෂය අවසානයේදී රු.8,000,000/- ක් අලෙවිකරණ වියදම් ලෙස දැරීමට සැලසුම්කොට ඇත. මීට අමතරව, 1 වන වර්ෂයේ සිට 5 වන වර්ෂය දක්වා සෑම වර්ෂයක් අවසානයේදීම විකුණුම් වටිනාකමින් 6% ක් විකුණුම් කොමිස් ලෙස ගෙවනු ලැබේ.

සමාගම, වර්ෂයකට 30% ක් වන අනුපාතයට ආදායම් බදු ගෙවනු ලබන අතර, එය එම වර්ෂය තුළදීම ගෙවිය යුතු වේ. සමාගමේ වාර්ෂික ප්‍රාග්ධන පිරිවැය 15% ක් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) යන්ත්‍රය පිළිසකර කිරීමේ ශුද්ධ වර්තමාන අගය [Net Present Values (NPV)] **ගණනය කරන්න.** (ලකුණු 13)

(b) සමාගම විසින් පවතින යන්ත්‍රය පිළිසකර කළ යුතුද නැද්ද යන්න **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 15)

JMC vLearning
"your virtual learning partner"

Variance Analysis

(A) **සීමාසහිත Pixy සමාගම,** පාසැල් සඳහා භාවිත කිරීම පිණිස දරුවන්ට ආරක්ෂිත තීන්ත නිෂ්පාදනයේ යෙදී සිටී. පහත සඳහන් තොරතුරු ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදී:

	රු. (ඒකකයකට)
සෘජු ද්‍රව්‍ය:	
A අමුද්‍රව්‍ය (ලීටරයක් රු.400/- ක් බැගින් ලීටර් 3 ක්)	1,200
B අමුද්‍රව්‍ය (ලීටරයක් රු.2,000/- ක් බැගින් ලීටර් 0.25 ක්)	500
සෘජු ශ්‍රමය (පැයකට රු.1,400/- ක් බැගින් මිනිත්තු 45)	1,050
විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.1,100/- බැගින්)	825
මුළු විචල්‍ය පිරිවැය	**3,575**
විකුණුම් මිල	3,800
දායකය	**225**

2024 ජුනි මාසය සඳහා, සමාගම විසින් ඒකක 40,000 ක් විකිණීමට ඇස්තමේන්තුගතකොට තිබූ අතර, මාසය සඳහා අයවැයගත ස්ථාවර පිරිවැය රු.6,425,000/- ක් වේ.

මාසය සඳහා වන සත්‍ය නිෂ්පාදනය / විකුණුම් ඒකක 37,600 ක් වු අතර, 2024 ජුනි 30 දිනෙන් අවසන් මාසය සඳහා වන සත්‍ය කාර්යසාධනය පහත දි ඇත:

	රු.
විකුණුම් ආයභාරය (ඒකක 37,600)	145,888,000
සෘජු ද්‍රව්‍ය:	
A අමුද්‍රව්‍ය (ලීටර් 114,800)	41,902,000
B අමුද්‍රව්‍ය (ලීටර් 8,648)	18,005,136
සෘජු ශ්‍රම පිරිවැය (පැය 27,400)	38,908,000
විචල්‍ය පොදුකාර්ය	30,003,000
ස්ථාවර පොදුකාර්ය	6,516,800

ඔබ විසින් කළ යුතු ද:

2024 ජුනි මාසය සඳහා පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න:**

(a) සෘජු ද්‍රව්‍ය මිල විචලනය (Direct Material Price Variance). (ලකුණු 02)

(b) සෘජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය (Direct Material Mix Variance). (ලකුණු 03)

(c) සෘජු ද්‍රව්‍ය ඵලදා විචලනය (Direct Material Yield Variance). (ලකුණු 03)

(d) සෘජු ශ්‍රම අනුපාත විචලනය (Direct Labour Rate). (ලකුණු 02)

(e) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය (Direct Labour Efficiency Variance). (ලකුණු 02)

(f) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය (Fixed Overhead Expenditure Variance). (ලකුණු 02)

JMC vLearning
"your virtual learning partner"

Your lecturer

- *ACA (SL) with prestigious title of "Youngest CA Member of the Year – 2024"*
- *MAAT (SL): Prize winner- 1st in order of merit in the level 02, 3rd in order of merit and subject prize for audit and assurance in the level 03*
- *Bsc. Finance (Special) , USJ*
- *Ex - Analyst at EY transaction and Corporate Finance Advisory Service.*
- *Over 3+ years experience in auditing field*
- *Over 4+ years experience in lecturing*

AAT Memory Wall





SUBJECT		NAME OF PRIZE WINNER	EXAM CENTRE	INDEX NO.	REG. NO.
AA3 EXAMINATION					
AA31	FINANCIAL ACCOUNTING AND REPORTING GANAKA AMARASINGHE PRIZE	MS. A.M.S.R. SUMUDUMALI	BADULLA	90909	3059500
AA32	MANAGEMENT ACCOUNTING AND FINANCE INDRAKA LIYANAGE PRIZE	MR. P.A.D.C. PRABHATH	GAMPAHA	94296	2919164
AA34	PROCESSES, CONTROLS AND AUDIT BDO PARTNERS PRIZE	MR. M.M.A. SAMPATH	GALLE	88050	2919782
AA35	CORPORATE AND PERSONAL TAXATION PRICEWATERHOUSECOOPERS PRIZE	MR. P.A.D.C. PRABHATH	GAMPAHA	94296	2919164

SUBJECT		NAME OF PRIZE WINNER	EXAM CENTRE	INDEX NO.	REG. NO.
TALENT (SKILLS) CAPSTONE EXAMINATION					
SS1	EFFECTIVE COMMUNICATION SKILLS SJMS ASSOCIATES PRIZE	MS. M.A.S. FERNANDO	GAMPAHA	94280	2916899
SS2	INFORMATION TECHNOLOGY SKILLS SRI LANKA TELECOM PRIZE	MR. P.A.D.C. PRABHATH	GAMPAHA	94296	2919164

G.C.E. (A/L) EXAMINATION 2019

Examination	G.C.E. (A/L) EXAMINATION
Year	2019
Syllabus	NEW
Name	MURAMUDALIGE AMILA SAMPATH
Index Number	5573769
NIC Number	200033102955
District Rank	10
Island Rank	113
Z-Score	2.1882
Subject Stream	COMMERCE

ECONOMICS	A
BUSINESS STUDIES	A
ACCOUNTING	A
COMMON GENERAL TEST	056
GENERAL ENGLISH	C

CA

THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS OF SRI LANKA





Finally Achieved ACA Dream

Thank
You
JMC e-Learning
"your virtual learning partner"